සේරුවිල ප්‍රාදේශීය සභාව

-----------------------------

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

---------------------------

1 **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------------

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 17 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 12 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් රු. 1,809,465 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි ශේෂ පත්‍රයට ගෙන නොතිබුණි.

(ආ) සභාවේ ස්ථාවර තැන්පතු හතරක 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොලී ආදායම වූ රු.598,030 ක මුදල ආදායම් ප්‍රකාශයට නොගැනීමෙන් ප්‍රවර්ථන වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ප්‍රවර්ථන වර්ෂයේ අවලංගු කරන ලද චෙක්පත් හයකට අදාල වටිනාකම වූ රු.76,000 ක් මුදල් පොතට හර නොකිරීම හේතුවෙන් මුදල් පොතෙහි 2015 දෙසැම්බර් මස අවසාන ශේෂය රු. 76,000 කින් අඩුවෙන් දක්වා තිබිණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

------------------------------------------

රු. 608,336 ක් වූ කොන්ත්‍රාත් තුනක රැඳවුම් මුදල් වලට අදාලව කොන්ත්‍රාත් ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.3 **නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්.**

-------------------------------------------------

නිකුත් කර මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු. 51,950 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 237 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2. **මුල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මුල්‍ය ප්‍රතිඵලය**

-----------------

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,642,265 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,516,011 ක් විය.

පසුගිය වර්ෂයට සාපේක්ෂව අනෙකුත් අමතර ලැබීම වල වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලය රු. 1,126,254 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 **ආදායම් පරිපාලනය**

-----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය**

---------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| --- | --- | --- | --- |
| | රු..000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 25 | 2 | 23 |
| බදු කුලී | 2,986 | 4,206 | - |
| බලපතු ගාස්තු | 636 | 661 | - |
| වෙනත් ආදායම් | 20,885 | 18,818 | 2,067 |

2.2.2 **කඩ කාමර කුලී**

-----------------

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ බදු කුලී ආදායම රු. 230,306 ක මුදල 2016 මැයි 25 වන දින තෙක් අයකර ගෙන නොතිබුණි.

2.2.3 **මුද්දර ගාස්තු**

---------------

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හදුනා ගැනීමට සහ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය**

--------------------------------------

(අ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පිහිටි ප්‍රාදේශීය සභා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ සංඛ්‍යා ලේඛණ අනුව, 2013 හා 2014 වර්ෂයන්හිදී රෝගීන් 1200 කට පමණ ප්‍රතිකාර කර තිබුණත් මෙහි සේවය කල ආයුර්වේද වෛද්‍ය නිලධාරියා ඉවත්ව යාමෙන් පසු මෙම වෛද්‍ය මධ්‍යස්ථානය 2014 ජුනි මස සිට වසා තිබීමෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට සේවය සපයා ඔවුන්ගේ සෞඛ්‍ය මට්ටම් නංවාලීමේ ප්‍රාදේශීය සභාවේ අරමුණු ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) වසර දෙකකට ආසන්න කාලයක් ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය වසා තිබීම හේතුවෙන් එහි ඇති රු. 23,314 ක් වටිනා බෙහෙත් ඖෂධ 34 ක් භාවිතයට ගත නොහැකි වී තිබුණි.

3.2 **කළමනාකරණ අකර්යක්ෂමතා**

----------------------------------

(අ) 2015 වර්ෂයට අදාලව 2016 ජනවාරි 31 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සමීක්ෂණ මණ්ඩලය විසින් හදුනා ගන්නා ලද අළුත්වැඩියා කලයුතු හා විනාශ කලයුතු භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරානොගෙන සභාව විසින් 2015 දෙසැම්බර් 31 වන විට රු. 112,446,047 ක ක්‍රීඩාංගන, පොදු ළිං, ප්‍රජා ශාලා, ජල ටැංකි, සුසානාගාර හා පොදු වෙළඳපලවල් ආදිය ඉදිකර තිබුණි. මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි.

(ඇ) පළාත් පාළන , පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය අනුව මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද, සභාව සතු වාහන 10 ක් සම්බන්ධවෙන් එසේ කර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 750 අනුව සියලුම රජයේ වාහන සදහා ශ්‍රී ලංකා රජයේ සළකුණ යෙදිය යුතු වුවත්, ප්‍රාදේශීය සභාව සතු වාහන 23 ක් සදහා ශ්‍රී ලංකා රජයේ සළකුණ යොදා නොතිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 1645 අනුව වාහන වගකිව යුතු නිළධාරියෙකු භාරයේ තැබිය යුතු අතර, එම නිළධාරියා විසින් ලොග් සටහන් පොත් පවත්වාගෙන යා යුතු වූවත් සභා වාහනවලට අදාල ලොග් සටහන් පොත්වල වාහනය පිළිබද විස්තරය, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාහනයේ ආයුධ හා අමතර උපකරණ පිළිබද විස්තර ඇතුළත් කර නොතිබුණි.

(ඊ) සභාව සතු ධාවනයේ පවතින වාහන 13 ක් සදහා සමාලෝචිත වර්ෂයට අදාලව අදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(උ) 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2015 අනුව රජය සතු ආයතන වෙතින් මෝටර් රථ සදහා රක්ෂණාවරණ ලබා ගැනීමේදී ගත යුතු වුවත්, සභාව විසින් රක්ෂණ නියෝජිතයකු මාර්ගයෙන් වාහන 09 ක් සදහා රක්ෂණාවරණ ලබා ගෙන තිබුණි.

**3.3 වීදි නාම පුවරු සවි කිරීම**

-----------------------------

වීදි නාම පුවරු 30 ක් සකස් කොට කොන්ක්‍රීට් යොදා සවි කිරීම වෙනුවෙන් රු. 405,000 ක මුදලක් 2014 දෙසැම්බර් 23 වන දින සභා අරමුදලින් වියදම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 08 වන පරිච්ඡේදය 9.1 ප්‍රකාරව රු. 250,000 වැඩි කොන්ත්‍රාත් සඳහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් ලබා දිය යුතු වුවද, මෙම වීදි නාම පුවරු සවිකිරීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් සැපයුම්කරු සමග ගිවිසුම් අත්සන් කර නොතිබිණි.

(ආ) මෙම නාම පුවරු සවිකිරීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම 2014 දෙසැම්බර් 22 දින සිදුකර තිබුණත් මිල ගණන් කැඳවූ දිනට පසු දින වූ 2014 දෙසැම්බර් 23 වන දින නාම පුවරු සවි කිරීම සම්පූර්ණ කල ලෙසට වියදම සහතික කොට සැපයුම්කරුට රු.405,000 ක් ගෙවා තිබුණි.

(ඇ) සකස් කරන ලද නාම පුවරු 10 ක් පමණක් සවි කර තිබුණු අතර, නාම පුවරු සවි කිරීමට ප්‍රථම මුදල් ගෙවීම හේතුවෙන් ඉතිරි නාම පුවරු 20ක් 2016 මැයි 25 දින වන විටද සවි කිරීමෙන් තොරව ප්‍රාදේශීය සභා භූමිය තුල දක්නට ලැබිණි.

3.4 **LED දැන්වීම් පුවරුව සකස් කිරීම**

--------------------------------------

නගර අලංකරණය සහ සභාවට ආදායමක් ලබා ගැනීමේ අරමුණින් ප්‍රාදේශීය සභාව විසින් දැන්වීම ප්‍රචාරය සඳහා LED දැන්වීම් පුවරුවක් සවි කිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 938,000 ක් 2014 මාර්තු 10 දින වියදම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 08 වන පරිච්ඡේදය 9.1 (ආ) ඡේදය ප්‍රකාරව රු. 250,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත් සඳහා ගිවිසුම් අත්සන් කල යුතු වුවද, මෙම දැන්වීම් පුවරුව සවිකිරීම වෙනුවෙන් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) මෙම දැන්වීම් පුවරුව ලබා ගැනීමේ දී යෙදිය යුතු ආලෝක ප්‍රමාණය හා ප්‍රචාරය කල හැකි දැන්වීම් ප්‍රමාණය පිළිබඳ සැළකිල්ලක් නොදක්වා අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු ධාරිතාවයෙන් යුත් නාම පුවරුවක් සවි කර තිබුණි. එම නිසා යෙදිය යුතු ආලෝක ප්‍රමාණයට වඩා ආලෝකය යෙදීමත්, තිරය මත එකවර වැඩසටහන් කිහිපයක් විවෘත කිරීමත් හේතුවෙන් 2014 මාර්තු 17 දින දැන්වීම් පුවරුව අක්‍රීය වී තිබිණි.

(ඇ) දැන්වීම් පුවරුව සවි කිරීමෙන් පසු සැපයුම්කරුගේ වගකීම් මොනවා ද යන්න හඳුනා නොගැනීමත්, වගකීම් සහතිකයක් ලබා නොගැනීමත් නිසා සවි කර දින 07 කින් අක්‍රීය වුවද, සභාවට එය අළුත්වැඩියා කර ගැනීමට නොහැකි වීමෙන් මේ වෙනුවෙන් වැය කර තිබූ මුදල නිශ්කාර්ය වියදමක් වී තිබිණි.

3.5 **කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

3.5.1 **ප්‍රාදේශීය සභා ගොඩනැඟිල්ල ඉදිකිරීම**

------------------------------------------

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලය සඳහා දෙමහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට රු. 27,709,341 වටිනාකමට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 දෙසැම්බර් 17 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි.2016 මැයි 25 දින කරන ලද භෞතික පරික්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ගොඩනැගිල්ලේ ඉංජිනේරු ඇස්තමේන්තුවල දක්වා ඇති පිරිවිතයන්ට අනුකූලය සහා ගොඩනැගිල්ලේ දොරවල් සහ ජනේල ඉදිකර නොතිබූ අතර, ඒවා ඇස්තමේන්තු පිරිවිතයන්ට අනුව ඉදිකර ඇති බවට සහතික කරමින් රු. 1,842,680 ක් ගෙවා තිබුණි.

(ආ) ගොඩනැගිල්ලෙහි ඉදිකර තිබූ වීදුරු ජනේල 105 සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු ප්‍රකාරව ආවරණය වෙනුවෙන් වර්ග මීටර් 140 කට රු. 630,000 ක් වෙන්කර තිබුණද, එම ආවරණ යොදා නොතිබූ අතර, එය සභාවේ ආරක්ෂාවට ගැටළුවක් වී තිබුණි.

(ඇ) මෙහි වැසිකිළි පද්ධතියේ ජලනල මගින් ජලය කාන්දු වීම නිසා ජලය උතුරා යාමෙන් සහා ගොඩනැගිල්ල තුල සකස් කරන ලද වැසිකිළි දෙකම භාවිතයට නොහැකි වී තිබුණි.

(ඈ) 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 30,065,945 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බදු (CIGFL) වන රු. 75,165 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 **ප්‍රාදේශීය සභා ගරාජය ඉදිකිරීම.**

-------------------------------------

සභාව සතු වාහන ගාල් කිරීම සඳහා 2015 මැයි 18 දින සභා අරමුදලින් රු. 493,250 ක් වැය කර ගරාජයක් ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 08 වන පරිච්ඡේදය 9.1 (ආ) ඡේදය ප්‍රකාරව රු. 250,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත් සඳහා ගිවිසුම් අත්සන් කල යුතු වුවද, මෙම ගරාජය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) ගරාජය නිසි ලෙස නිම කර ඇති බවට වගකිව යුතු නිලධාරියා විසින් සහතික කර මුදල් ගෙවා තිබුණු නමුත් මෙය ඉදිකිරීමේ දී සත්‍ය වශයෙන් යොදා තිබූ ද්‍රව්‍ය හා ගෙවා තිබූ බිල්පත සංසන්දනය කිරීමේ දී රු. 35,150 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුබව 2016 මැයි මස 25 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

| විෂයය | බිල් පතෙහි ගෙවා තිබූ ප්‍රමාණය | සත්‍ය වශයෙන් යොදා තිබූ ප්‍රමාණය | ඌනතාවය | ඒකක මිල | වැඩිපුර ගෙවා ඇති මුදල |
|---|---|---|---|---|---|
| ------ | --------- | --------- | ---------- | ------ රු. | ---------- රු. |
| 2 ″ GI බට | 20 | 15 | 5 | 4,150 | 20,750 |
| 1 ″ GI බට | 24 | 20 | 4 | 1,850 | 7,400 |
| බට නැමීම සඳහා | - | - | - | - | 7,000 |
| වැඩිපුර ගෙවා ඇති මුළු මුදල | | | | | **35,150** |

(ඇ) ගරාජය ඉදිකිරීම සඳහා සැපයුම්කරු වෙත සම්පූර්ණ මුදල ගෙවා තිබුණද, ප්‍රමිතියෙන් තොර මිශ්‍රණයකින් හා අඩු ඝනකමින් යුතුව කොන්ක්‍රීට් යෙදීම නිසා එහි පොළවට යොදා තිබූ කොන්ක්‍රීට් කැඩී යාමට ලක් වී තිබුණි. එමෙන්ම වහලය නිසි ලෙස සෙවිලි නොකිරීමෙන් වහලයට යොදා තිබූ තහඩු ඉරී පැවති අතර, වාහන වලට නිසි ආරක්ෂාවක් ලැබී නොතිබිණි.

3.6 **වත්කම් කළමනාකරණය**

---------------------------

ඌණ උපයෝජිත වත්කම්

------------------------------

ප්‍රාදේශීය සභාව සතු රු. 675,000 ක් වටිනා ඩබල් කැබ් රථය වසර එක හමාරක කාලයක සිට ඉදිරිපස බෝර් එක සහ ටයර් මාරු කල යුතු නිසාත් රු. 1,000,000 ක් වටිනා මහේන්ද්‍රා කැබ් රථය වසර තුනක කාලයක සිට ඩීසල් පොම්පයෙහි ගැටළුවක් නිසාත් එම වාහන භාවිතයට නොගෙන දිරාපත් වී තිබිණි.

3.7 පාරිසරික ගැටළු

--------------------

ජාතික පරිසර පනත් යටතේ පරිසර බලපත්‍ර නිකුත් කිරීම

------------------------------------------------------------------

1980 අංක 56 සහා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 ‘‘අ’’ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 13 කට අදාලව එම බලපත්‍ර නිකුත් නොකර වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

-------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 02 | 01 | 01 |
| ද්විතීක මට්ටම | 15 | 10 | 05 |
| තෘතීය මට්ටම | 22 | 18 | 04 |
| එකතුව | 39 | 29 | 10 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජුනි මස සිට පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය සභාවේ ආයුර්වේද වෛද්‍ය තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

[

(ආ) පුස්තකාලයාධිපති, විදුලි කාර්මික නිලධාරී, සංවර්ධන නිලධාරී, ආදායම් පරීක්ෂක යන තනතුරුවල වර්ෂ 02කේ සිට 05 දක්වා කාලපරිච්ඡේදයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට විගණිත දිනය වන විටද කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමණාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) මානව සම්පත් කලමනාකරණය